**දක්ෂිණ අධිවේගී මාර්ගය දීර්ඝ කිරීමේ ව්‍යාපෘතිය - 2014**

---------------------------------------------------------------

දක්ෂිණ අධිවේගී මාර්ගය දීර්ඝ කිරීමේ ව්‍යාපෘතියේ 2014 පෙබරවාරි 13 සිට 2014 දෙසැම්බර් 31 දක්වා වූ පළමු ගිණුම් කාල පරිච්ඡේදය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා චීන අපනයන ආනයන බැංකුව අතර 2014 දෙසැම්බර් 23 දින හා 2014 සැප්තැම්බර් 16 දින එළඹි 01 කොටස සඳහා අංක පීබීසී අංක (2014) 27 එකතු අංක (321), 03 කොටස සඳහා ජීසීඑල් අංක (2014) 17 එකතු අංක (520), හා 04 කොටස සඳහා ජීසීඑල් අංක (2014) 18 එකතු අංක (521) ගිවිසුම් යටතේ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලැබේ.

1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

--------------------------------------------------------------------------------------------

ව්‍යාපෘතියේ ණය ගිවිසුම් අනුව, මහාමාර්ග හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. හම්බන්තොට ජාත්‍යන්තර සංවර්ධන කේන්ද්‍රීය ව්‍යාපෘතියේ කාර්යයන්වලට සහායවීම හා පහසුකරලීමට මාර්ග ජාල සංවර්ධන කාර්යය සඳහා මාතර සිට හම්බන්තොට දක්වා කිලෝමීටර 96 ක දිගින් යුතුව දක්ෂිණ අධිවේගී මාර්ගය දීර්ඝ කිරීම ව්‍යාපෘතියේ අරමුණ ලෙස හඳුනාගෙන තිබුණි. දක්ෂිණ අධිවේගී මාර්ගයේ යෝජිත දීර්ඝ කිරීම මාතර සිට බෙලිඅත්ත, බෙලිඅත්ත සිට වැටිය, වැටිය සිට අන්දරවැව සහ මත්තල සිට හම්බන්තොට වශයෙන් කොටස් 4 කට වෙන්කර ඇත. ණය ගිවිසුම් අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 187,010 කට සමාන එජඩො මිලියන 1,469 ක් වන අතර ඉන් රු.මිලියන 171,518 කට සමාන එජඩො මිලියන 1,348 ක් සැපයීම සඳහා චීන අපනයන ආනයන බැංකුව එකඟ වී තිබුණි.

ව්‍යාපෘතිය එහි කටයුතු 2014 පෙබරවාරි 13 දින ආරම්භ කරන ලද අතර 2019 සැප්තැම්බර් 15 වන විට පළමු කොටස හා 2019 දෙසැම්බර් 22 වන විට අනෙකුත් කොටස් දෙක නිමකිරීමට සැලසුම් කරන ලදී. ඉතිරි කොටසේ නිම කිරීම මෙතෙක් තීරණය කර නොතිබුණි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

--------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.
මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව,

(ඇ) ශ්‍රී ලංකා රජය හා ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණයවලින් කරන ලද මිලදී ගැනීම් ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඉ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(ඊ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව සහ,

(උ) ණය ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

2. මූල්‍ය ප්‍රකාශන

----------------

2.1 මතය

--------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මා දරන්නාවූ මතය වනුයේ,

(අ) 2014 පෙබරවාරි 13 සිට 2014 දෙසැම්බර් 31 දක්වා කාල පරිච්ඡේදය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2014 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බව, සහ

(ඇ) ණය ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

3. මූල්‍ය හා භෞතික කාර්ය සාධනය

----------------------------------------

3.1 අරමුදල් උපයෝජනය

----------------------------

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය හා සමාලෝචිත වර්ෂය තුළ සහ 2014 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුමේ මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | **2014 වර්ෂය සඳහා අයවැය ප්‍රතිපාදනය** | සමාලෝචිත කාල පරිච්ඡේදය තුළ උපයෝජනය කළ අරමුදල් | **2014 දෙසැම්බර් 31** දක්වා උපයෝජනය කළ අරමුදල් |
|---|---|---|---|---|---|
| | එ.ජ.ඩො මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| චීන අපනයන ආනයන බැංකුව | 1,348 | 171,518 | - | - | - |
| ශ්‍රී ලං ර | 121 | 15,492 | 144.7 | 70 | 70 |
| | 1,469 | 187,010 | 144.7 | 70 | 70 |

මාර්ග සංවර්ධන අධිකාරිය විසින් දේශිය වාණිජ බැංකුවකින් ලබාගත් රු.මිලියන 96 ක් වූ වෙනම ණය මුදලක් ව්‍යාපෘතියේ කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා උපයෝජනය කර තිබූ

බව නිරීක්ෂණය විය. කෙසේ වුවද ණය ආපසු ගෙවීම පිළිබඳ විස්තර විගණනයට පැහැදිලි කර නොතිබුණි.

3.2 භෞතික ප්‍රගතිය

---------------------

පාරිසරික බලපෑම ඇගයීම, ශක්‍යතා අධ්‍යයනයන් හා ඉඩම් අත්පත් කරගැනීම ආදී කාර්යයන් සමාලෝචිත කාල පරිච්ඡේදය තුළ ආරම්භ කර තිබූ අතර 2014 දෙසැම්බර් 31 දිනට කිසිදු මාර්ග ඉදිකිරීමේ කාර්යයක් ආරම්භ කර නොතිබුණි.

3.3 කොන්ත්‍රාත් පරිපාලනය

------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) නිශ්චිත ව්‍යාපෘති කාල පරිච්ඡේදය තුළ ව්‍යාපෘතියේ සාර්ථක ක්‍රියාත්මක කිරීම තහවුරු කර ගැනීම සඳහා විස්තරාත්මක සමස්ත සැලැස්මක් හා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් තිබිය යුතුය. එම සැලසුම් ව්‍යාපෘතිය විසින් පිළියෙල කර නොතිබුණි.

(ආ) මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගැනීමෙන් තොරව පාරිසරික බලපෑම් ඇගයීම හා ශක්‍යතා අධ්‍යයනයන් ආදිය සිදු කිරීම සඳහා රු.මිලියන 4.75 ක මුදලක් මාර්ග සංවර්ධන අධිකාරියේ නිලධාරීන්ට ව්‍යාපෘතිය විසින් ගෙවා තිබුණි.

3.4 මතභේදයට තුඩුදෙන කරුණු

----------------------------------

මාර්ග සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් ව්‍යාපෘතිය විසින් වාහන 50 ක් කුලියට ලබාගෙන තිබූ අතර ප්‍රසම්පාදන පරිපාටිය සඳහා සුදුසුකම් ලැබූ මනාප පාර්ශවයන් සඳහා සාධාරණ හා සමාන අවස්ථා ලබා දීමෙන් තොරව සමාලෝචිත කාල පරිච්ඡේදය තුළ රු.මිලියන 23 ක මුදලක් ඒ සඳහා දරා තිබුණි.